// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1792/10 - 2013 ජනවාරි මස 09 වැනි බදාදා - 2013.01.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්ජී/2020.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට, ආසියානු සංවර්ධන බැංකු 5 ව්‍යාපෘතිය යටතේ මන්නාරම ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ තුළුමං ළිඳ අංක 01 ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2012 දෙසැම්බර් මස 31 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර", නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/987.

### උපලේඛනය

මන්නාරම දිස්ත්‍රික්කයේ, නානත්තන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුරුන්කන් ග්‍රාම නිලධාරී වසමේ, මුරුන්කන් ගමේ පිහිටි කුඹුරු ඉඩම නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් 0.040 (මීටර් 20xමීටර් 20)ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මැදවච්චිය-මන්නාරම් ප්‍රධාන මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | ගොඩ ඉඩම ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 01. ගෝපාලසිංගම් මහතා,
ස්වර්ණවයල්,
මුරුන්කන්.

01-640

1A - G 017116— 345 (2013/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.